# නවීකරණය හරහා සිදුවන සමාජ සංස්කෘතික වෙනස් වීම (රුහුණු මාගම්පුර වරාය ආශ්‍රයෙන්)

ආර්. එම්. යු. මධුභාෂිණී, එල්. එච්. එච්. කුමුදුමාලී
සේපාල සමරසේකර,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
sepalasamarasekara@gmail.com

සමාජ හා සංස්කෘතික වෙනස් වීම යනු කිසියම් සමාජයක පවතින සමාජයීය, අධ්‍යාත්මික, ද්‍රව්‍යාත්මක හා ශිෂ්ට බව යන සංකල්ප එක් ආකාරයක සිට තවත් ආකාරයකට පරිවර්තනය වීමේ ක්‍රියාවලියයි. මේවා මගින් සිදු වන වෙනස්වීම නවීකරණයයි. එනම් දේශපාලනික, ආර්ථික, තාක්ෂණික ආදී වශයෙන් රටක සිදු වන ඉදිරියට යෑම දියුණුවීම හෝ වෙනත් ආකාරයක පරිවර්ථන නවීකරණය ලෙස හැඳින්විය හැකිය. හම්බන්තොට මිරිජ්ජවිල ප්‍රදේශය මුල් කොට ගෙන ගොඩණැගුනු රුහුණු මාගම්පුර වරාය හරහා එම ප්‍රදේශයේ සිදු වූ නවීකරණය හා එහි ප්‍රථිවිපාක පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. වරාය සංවර්ධන ව්‍යාපෘතිය නිසා පවුල් 200ක් පමණ අවතැන් වූ අතර “වරාය ගම්මානය” ලෙස ගොඩණැගූ නව ජනපදයෙහි ඔවුන් පදිංචි කර ඇත. එයින් අහඹු ලෙස තෝරාගත් පවුල් 40ක නියැදියක් සෘජු දත්ත ලබාගැනීම සඳහා යොදාගන්නා ලදී. මෙම පර්යේෂණය සඳහා පදිංචිය, නිවාස, ජීවනෝපායන්හි හා එදිනෙදා ජීවිතයේ සිදුවූ නවීකරණය පිළිබඳ සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් මගින් ප්‍රදේශවාසීන්ගෙන් තොරතුරු ලබා ගත් අතර, ලිඛිත මූලාශ්‍රය ලෙස ව්‍යාපෘතිය පිළිබඳ ලිඛිත වාර්ථා, පොත්පත් හා අන්තර්ජාලය භාවිත කරන ලදී. නියැදියෙහි 50 පමණ පවුල් වල අවම වශයෙන් එක් සාමාජිකයෙකුට හෝ වරාය ව්‍යාපෘතිය හරහා රැකියා හිමිවී ඇත. 60 පමණ පවුල්වලට ඔවුන්ගේ සම්ප්‍රදායික ජීවනොපාය වූ ධීවර කර්මාන්තය අහිමි වීඇත. තවත් 20කට පමණ තම ධීවර කටයුතු පෙර මෙන් සාර්ථකව කර ගැනීමට අපහසුතා ඇතිවූ බව සඳහන්විය. ඊට අමතරව ප්‍රදේශයේ මුල් පදිංචිකරුවන්ගේ ඉඩම් අහිමි වීම හා පදිංචිය වෙනස්වීම ආදිය මගින් ඔවුන්ගේ සමාජ හා සංස්කෘතික තත්ත්වය වෙනස් වී ඇති අයුරු නිරීක්ෂණය විය. එසේ ම වරාය ව්‍යාපෘතියේ බලපෑමට ලක්වූවන්ගේ සුබසාධනය සඳහා ජලය විදුලිය ආදී යටිතල පහසුකම් හා සේවා වැඩි දියුණු වී තිබුනද ඒවායින් නිසි ප්‍රයෝජන ගෙන නොමැතිබව හා පවත්වාගෙනයාමට ඇති උනන්දුව යහපත් මට්ටමක නොතිබූ බව නිරීක්ෂණය විය. එයට හේතුවී ඇත්තේ ප්‍රධාන වශයෙන් ඒවා නොමිලයේ හා උත්සාහයකින් තොරව රජය ආදී බාහිර පාර්ෂ්ව වලින් ලැබුණේය යන හැඟීම නිසා බව හඳුනාගැණිනි. සමස්ථයක් ලෙස ගත් විට ආර්ථික සහ සුබසාධන යන අංශ යන්හි ප්‍රබල වෙනස්කම් දක්නට ලැබුනත්, අධ්‍යාපන, සෞඛ්‍ය, ආගමික වශයෙන් විශාල වෙනස්කම් සිදු වී නොමැත. සංවරධනය හරහා සිදුවන නවීකරණය වඩාත් සාර්තක වීමටනම් එය බාහිර පාර්ෂවයන්හි අවශ්‍යතා අනුව පමණක් නොව තමන්ගේය යන හැඟීම ප්‍රදේශවාසීන් තුළ ඇතිකිරීමේ වැඩපිළිවෙලක් එයට ඇතුළත් වියයුතුය.

**ප්‍රමුඛ පද:** සංස්කෘතිය; නවීකරණය; සමාජ වෙනස්වීම; සංවර්ධනය